# අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II** | පැය තුනයි

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

සැලකිය යුතුයි :
(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම පත්‍රය සඳහා **ලකුණු 40ක්** හිමි වේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

- අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන පිළිතුර තෝරන්න.

**1.** හිත මිතුරන්ගේ **කෙනෙහෙළිකම්** සිරිදාසගේ දියුණුවට හේතු වූ බව තතු දන්නෝ පවසති.
(1) දැඩි හිතවත්කම් (2) සිත් රිදවන හැසිරීම්
(3) මග පෙන්වීම් (4) බල කිරීම්

**2.** තමා උපයන මුදලින් කොටසක් **අසක්කුවකට** ගැනීම සඳහා වෙන් කර තැබීම ඔහුගේ සිරිත විය.
(1) අනාගතයට (2) නැති බැරි වෙලාවකට
(3) ඉතා හදිසියකට (4) පුණ්‍ය කටයුතුවලට

**3.** ඇතැම් මිතුරන් සමග කළ **පයුරුපාසනය** තම ජීවිතයේ වෙනස්කම් ඇති කිරීමට හේතු වූ බව ඔහු පැවසීය.
(1) අදහස් හුවමාරු කර ගැනීම (2) මුදල් ගනුදෙනු කිරීම
(3) සමීපයේ ඉඳ ගැනීම (4) ඉතා ළඟින් ඇසුරු කිරීම

**4.** ඔහු **ඉණ ඉහ විකුණා** කටයුතු කළේ දරුවන්ට උසස් අධ්‍යාපනයක් ලබා දීම සඳහා ය.
(1) සියලු සම්පත් වැය කර (2) දේපළ උකසට තබා
(3) මුදල් පොලියට ගෙන (4) ඇඳුම් සියල්ල විකුණා

- අංක **5** සිට **7** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

**5.** සතුරන්ගේ සියලු ප්‍රයත්න ............................ කරමින් සෙන්පති සටනින් ජය ගත්තේ ය.
(1) විධ්වංසනය (2) ප්‍රතිෂේධනය (3) ව්‍යර්ථ (4) වියුක්ත

**6.** දහ නව වන ව්‍යවස්ථා ............................ සම්බන්ධයෙන් විද්වත්හු විවිධ මත පළ කරති.
(1) ලේඛනය (2) කෙටුම්පත (3) ප්‍රකාශනය (4) විශෝධනය

**7.** උචිත අනුචිත දේ තෝරා ගැනීමේ හැකියාව ............................ ලෙස හැඳින්වේ.
(1) ප්‍රතිභාව (2) විචක්ෂණභාවය (3) ව්‍යුත්පත්තිය (4) බහුශ්‍රැතභාවය

**8.** සෑම පදයක ම **අක්ෂර වින්‍යාසය නිවැරදි** ව යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) කථන ව්‍යවහාරයේ දී ශබ්ධ රටා ශ්‍රව්‍ය ගෝචර ලෙස භාවිත කෙරෙන අතර ලේඛන ව්‍යවහාරයේ දී ශබ්ධ රටා දෘෂ්ඨි ගෝචර ලෙස සංකේතවත් කෙරෙයි.
(2) ශ්‍රී ලංකාවේ ඉපැරණි වාරි තාක්ෂණය පිළිබඳ ව පැරැන්නන් සතුව තිබූ ශිල්පීය ඥාණය ඔවුන්ගේ අප්‍රතිහත ධෛර්‍ය්‍යයේ මහඟු ඵලයක් ලෙස අර්ථ කථනය කළ හැකි ය.
(3) කිසියම් නිර්මාණයක රස නිෂ්පත්තිය උද්දීපනය සඳහා වාච්‍යාර්ථය පමණක් නොව ව්‍යංගාර්ථය ද බලපායි.
(4) ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට අනුව ඖෂධ වර්ග නිෂ්පාදනය කෙරෙනුයේ ස්වභාවධර්මය හා මිනිසා අතර ඇති අවියෝජනීය බැඳීමට හානියක් නොවන පරිදි ය.

**9.** "දිසිත ලියන් නොකම සේය
**විසිත කියන** ගී රසේය"
මෙහි තද කළු අකුරින් මුද්‍රිත පදය
(1) මිශ්‍ර ක්‍රියාවකි (2) විධි ක්‍රියාවකි
(3) කෘදන්තයකි (4) ක්‍රියා නිපාතයකි

[ 2 වන පිටුව බලන්න

**10.** අම්මා දරුවා දෙස ආදරයෙන් බැලූවා ය. යන වාක්‍යයේ **ආදරයෙන්** යනු
(1) ක්‍රියා විශේෂණයකි (2) නිපාත පදයකි (3) නාම විශේෂණයකි (4) කෘදන්ත පදයකි

- අංක **11** සහ **12** ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත යෙදුම් සඳහා **වඩාත් සුදුසු තනි පදය** තෝරන්න.

**11. "ඉමහත් සේ සතුටු වීම"**
(1) හාසයෝත්පාදනය (2) ප්‍රීත්‍යුන්මාදය (3) අමන්දානන්දය (4) සන්තුෂ්ටිය

**12. "අනවශ්‍ය ලෙස බොහෝ සෙයින් කතා කරන"**
(1) මුඛරි (2) වාචාල (3) කෙලතොලු (4) චතුර

**13.** යුගල පදයක් **නොවන** යෙදුමක් සහිත වරණය තෝරන්න.
(1) තාඩන පීඩන, නහින දෙහින, රොස් පරොස්, අල්ල පනල්ලෙ
(2) අතින් පයින්, ලට්ට ලොට්ට, ඉහළ පහළ, මුතු මැණික්
(3) ආරලු බීරලු, තක්කු මුක්කු, රෙදි පෙරෙදි, කසු කුසු
(4) ඔප්පු තිරප්පු, දඩි බිඩි, සට කපට, වටින් පිටින්

- අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ **අර්ථය නිවැරදි ව** දැක්වෙන වරණය තෝරන්න.

**14.** සාහිත්‍යකරුවා සතු **සතතාභ්‍යාසයෙහි යෙදීමේ** ප්‍රවණතාව සාහිත්‍ය නිර්මාණ බිහි වීමේ හේතුවක් ලෙස සැලකේ.
(1) සත්‍ය කරුණු නිර්මාණයට පාදක කර ගැනීමේ (2) රස නිෂ්පත්තියට ප්‍රමුඛතාව දීමේ
(3) උචිත අනුචිත දේ තෝරා ගැනීමේ (4) නිරන්තරයෙන් නිර්මාණකරණයෙහි යෙදීමේ

**15.** වාපි සංස්කෘතියේ තවත් වැදගත් අංගයක් වනුයේ **වැව් තාවුල්ල** යි.
(1) වැවේ දියවර රඳා ගන්නා සීමාවෙන් ඉහළ ප්‍රදේශය යි. (2) වැවේ ජලය ගලා යන බෑවුම යි.
(3) වැවේ දිය රැළි පාලනයට යෙදූ දිය කඩනය යි. (4)වැවේ වතුර අඩුවෙන් දක්නට ලැබෙන තැන යි.

**16.** සිංහල ගීතයේ අභිවෘද්ධිය සඳහා කළ යුතු කාර්යයන් **ප්‍රත්‍යාවලෝකනය කිරීම** විද්වතුන්ගේ අවධානයට යොමු විය යුතු ය.
(1) යළි සිතා බැලීම (2) යළි ආවරණය කිරීම
(3) යළි අවධාරණය කිරීම (4) යළි තීරණය කිරීම

**17.** පොල්තෙල් ශරීරයට අහිතකර නොවන බව බොහෝ දෙනෙක් පිළිගනිති. මෙහි **පොල්තෙල්** යන පදය අයත් සමාසය වනුයේ
(1) දකාරාර්ථ සමාසය (2) විශේෂණ සමාසය
(3) විභක්ති සමාසය (4) අන්‍යාර්ථ සමාසය

**18.** පරස්වරලෝප සන්ධිය, ස්වර සන්ධිය, පූර්වස්වරලෝප සන්ධිය, ස්වරාදේශ සන්ධිය යන **සන්ධි සඳහා ගැළපෙන පද පිළිවෙළින්** දැක්වෙන වරණය තෝරන්න.
(1) නිලඹර, මුනිඳු, මන්දෝත්සාහී, මාර්ගාසන්න
(2) මිණිබරණ, නෙතගින්, සුරත, පූජෝත්සවය
(3) සියතින්, රියැදුරු, එකිනෙක, ඇගසව්
(4) නිලුපුල්, ශ්‍රවණේන්ද්‍රිය, ගුණැති, යථාවබෝධය

**19.** මුලින් දැක්වෙන පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ගෘහය - මන්දිරය, නිවස, ගෙය, භවන
(2) මෘදු - කොමළ, මොළොක්, සිනිඳු, සියුමැලි
(3) නිතර - නිරතුරු, නිති, අනවරත, නිබඳ
(4) සතුට - ආහ්ලාදය, සතොස, ප්‍රහර්ෂය, හාස්‍යය

**20.** එක් එක් පේළියේ මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් දෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) වස්ත්‍ර - පිළී, දුහුල්, රෙදි, කඩ
(2) පණ්ඩිත - බුද්ධිමත්, ප්‍රඥාවන්ත, පැණසර, නැණවත්
(3) ඉක්මන් - වහා, සෙද, යුහු, හෙමින්
(4) සමස්ත - සියලු, සකල, පිරිපුන්, සර්ව

**21.** නැවත අපි හමු වෙමු. යන වාක්‍යයේ **නැවත** යනු
(1) විශේෂණයකි (2) උපසර්ගයකි (3) තද්ධිතයකි (4) නිපාතයකි

[ 3 වන පිටුව බලන්න

**22.** ගුරුවරයා ද ඔබ ද පාසල් ගියෙහු. මෙහි **ගියෙහු** යන්න
(1) අතීත කාල, මධ්‍යම පුරුෂ, බහු වචන ක්‍රියා පදයකි
(2) අතීත කාල, ප්‍රථම පුරුෂ, බහු වචන ක්‍රියා පදයකි
(3) අතීත කාල, මධ්‍යම පුරුෂ, ඒක වචන ක්‍රියා පදයකි
(4) අතීත කාල, උත්තම පුරුෂ, ඒක වචන ක්‍රියා පදයකි

**23.** නිවැරදි අදහස සහිත වරණය තෝරන්න.
(1) පිළිමල් යනු වෛරී යන්නට පර්යාය පදයකි
(2) 'වල් අලි ගම වනසති' යන වාක්‍යයේ වල් යනු තද්ධිත පදයකි
(3) 'අඳුරුකුටිය තුළ දොරගුළු ලා ගෙන' යන ගීත ඛණ්ඩයේ අඳුරුකුටිය යනු විශේෂණ සමාසයකි
(4) 'කියමින් වෙන වෙන වාසී පෑ බල' මෙහි වාසී යනු ලාභය සඳහා යෙදුණු පර්යාය පදයකි

**24.** මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) කෘදන්ත - නැටුම, බැලිලි, අබිමන්, ලියුම
(2) නිපාත - විලස, තවද, වනාහි, තුරු
(3) සමාස - පන්සිල්, පැණිවළලු, සුගුණ, ගොපලු
(4) සන්ධි - කාලෝචිත, දෙවුර, ශාලාධිපති, රුපුනොද

- අංක **25** හා **26** යන ප්‍රශ්නවල එක් එක් ප්‍රකාශනයෙහි අදහසට **වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ** තෝරන්න.

**25.** තමාට අපහසු කාර්යයක් වෙනත් ක්‍රමයකින් කර ගැනීම
(1) අටුව කඩා පුටුව සෑදීම
(2) බූරුවා බල්ලාගේ වැඩේ කිරීම
(3) බළලුන් ලවා කොස් ඇට බෑවීම
(4) වේයන්ගේ තුඹසින් නාගයන් ප්‍රයෝජන ගැනීම

**26.** වැදගත් දෙයක් කරන්නට ගොස් අමාරුවේ වැටීම
(1) ඉඟුරු දී මිරිස් ගැනීම
(2) වඳින්න ගිය දේවාලය ඉහේ කඩා වැටීම
(3) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇනීම
(4) අඬුව තියෙද්දි අත පුච්චා ගැනීම

- අංක **27** හා **28** යන ප්‍රශ්නවල එක් එක් ප්‍රස්තාව පිරුළට **වඩාත් ගැළපෙන** අදහස තෝරන්න.

**27.** පාළුගෙයි වළං බිඳීම
(1) වැඩි ආරක්ෂාවට තිබූ දෙය විනාශ කිරීම
(2) ඵල රහිත ක්‍රියාවක යෙදීම
(3) හිමියන් නැති වස්තුව පැහැර ගැනීම
(4) බිය සැක නැතිව හිතුමනාපයේ යමක් කිරීම

**28.** අත හයිය නම් බත වරදී ද
(1) තමාගේ වැඩ තමා ම කර ගත යුතු බව
(2) උත්සාහය ඇත්නම් බත නොවරදින බව
(3) උත්සාහය ඇත්නම් සියල්ල ජය ගත හැකි බව
(4) අතේ හයියෙන් වැඩ කර ගත යුතු බව

- අංක **29** සිට **33** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූල ව **ගැළපෙන** නිවැරදි වරණය තෝරන්න.

**29.** (1) එක් කෙනෙක් හොඳින් ඉගෙන ගනිති.
(2) සමහරෙක් ඉතා උනන්දුවෙන් ඉගෙන ගනියි.
(3) පන්ති කාමරයට කිසිවෙක් පැමිණ නැත.
(4) ඇතැමෙක් එදින රැස්වීමට නොපැමිණියහ.

**30.** (1) කම්කරුවන් පාර කපද්දී ළමයි එදෙස බලා සිටියි.
(2) ගස්වැල් පරිසරය අලංකාර කරති'යි පරිසර වේදීහු ප්‍රකාශ කරති.
(3) මම උසස් ලෙස සමත් වුණොත් අම්මා සතුටු වෙයි.
(4) තාත්තා ද අම්මා ද මම ද කුඹුරට ගියෙමි.

**31.** (1) කුරුල්ලෝ කූඩු කරා පියාඹන අයුරු මම බලා සිටියෙමි.
(2) ඇතැමෙක් නටද්දී සමහරෙක් ගී ගැයූහ.
(3) දක්ෂ වෛද්‍යවරයෙකු වූ ඔහු නවකතා රචකයෙක් ද විය.
(4) ඕ තොමෝ තම මව දේවත්වයෙන් සලකති.

**32.** (1) මගේ නිවාසය නොහොත් ගෙදර පිහිටියේ වැවක් සමීපයෙහි ය.
(2) ගොවීහු රැස්වීමට සහභාගී වී නැත.
(3) ගුරුවරුන් සමග සිසුන් විනෝද චාරිකාව සංවිධානය කළහ.
(4) සේවකයන් හෙට දින සේවයට පැමිණේවි.

**33.** (1) මිනිස්සු කිහිප දෙනෙකු පාරේ වැඩ කරති.
(2) ලේඛකයන් විසින් වටිනා ලේඛන සකස් කෙරෙති.
(3) මැණියෝ දියණියන් පෝෂණය කළෝය.
(4) කොඩි පෙළ සුළඟට ළෙල දෙත්.

[ 4 වන පිටුව බලන්න

- අංක **34** සිට **36** තෙක් ඇති ප්‍රශ්නවල මුලින් දී ඇති වාක්‍යයේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** සහිත වාක්‍යය තෝරන්න.

**34.** විශ්වයේ ඇති කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත ග්‍රහ පද්ධතිවල ජීවය ඇති වීමට තිබෙන ඉඩකඩ අනන්ත අප්‍රමාණ බව නිගමනය කළ හැකිය.
(1) විශ්වයේ ඇති ග්‍රහ පද්ධතිවල ජීවය ඇති බව නිගමනය කළ හැකි ය.
(2) විශ්වයේ ඇති ග්‍රහ පද්ධතිවල ජීවය ඇති වීමට ඇති අවස්ථා අසීමිත බව නිගමනය කළ හැකි ය.
(3) විශ්වයේ කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත ග්‍රහ වස්තු ඇති අතර ඒවායේ ජීවය ඇති බව ස්ථිර ව කිව හැකි ය.
(4) විශ්වයේ ඇති ග්‍රහ පද්ධතිවල අනන්ත අප්‍රමාණ ජීවීන් වෙසෙන බව නිගමනය කළ හැකි ය.

**35.** ප්‍රස්තුත නිර්මාණයේ අරුත් ද නිර්මාණකරුවාගේ දක්ෂතාව හා අභිප්‍රේතාර්ථය පැහැදිලි කිරීම සඳහා රචකයා යොදා ඇති ක්‍රියාමාර්ගවල උචිතානුචිත භාවය ද සාහිත්‍ය විචාරයේ දී අවධාරණයට ලක් වේ.
(1) ප්‍රස්තුත නිර්මාණයේ අරුත් පැහැදිලි කිරීම සඳහා නිර්මාණකරුවා ගෙන ඇති ක්‍රියාමාර්ගවල උචිතානුචිත භාවය හා අභිප්‍රේතාර්ථය අවධාරණය කිරීම සාහිත්‍ය විචාරයේ දී සිදු වේ.
(2) ප්‍රස්තුත නිර්මාණය මගින් තම අභිප්‍රේතාර්ථය පැහැදිලි කිරීම සඳහා නිර්මාණකරුවා ගෙන ඇති ක්‍රියාමාර්ගවල උචිතානුචිත භාවය අවධාරණය කිරීම සාහිත්‍ය විචාරයේ දී සිදු වේ.
(3) සාහිත්‍ය නිර්මාණයේ ගැබ්වන අර්ථයත් නිර්මාණකරුවාගේ දක්ෂතාවත් අර්ථවත් ව ප්‍රකාශ කිරීම සඳහා සාහිත්‍යකරුවා ගෙන ඇති ක්‍රියාමාර්ගවල උචිතානුචිත භාවයත් අවධාරණය කිරීම සාහිත්‍ය විචාරයේ දී සිදු වේ.
(4) සාහිත්‍ය විචාරයේ දී සිදු විය යුත්තේ නිර්මාණකරුවා තම අභිමතාර්ථය හා ප්‍රස්තුත අරුත් සාක්ෂාත් කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල සාධනීය ලක්ෂණ සොයා බැලීම යි.

**36.** ඉන්දියානු සාගර වෙළෙඳ මාර්ග ආසන්නයේ කේන්ද්‍රීය ස්ථානයක පිහිටා තිබූ නිසාත් ස්වාභාවික වරාය කිහිපයක් ම තිබූ නිසාත් අතීතයේ සිට ම ශ්‍රී ලංකාව සමුද්‍රාසන්න වෙළෙඳ මධ්‍යස්ථානයක් විය.
(1) ඉන්දියානු සාගර වෙළෙඳ මාර්ග අසල කේන්ද්‍රීය ස්ථානයක පිහිටා තිබීමත් ස්වාභාවික වරාය කිහිපයක් තිබීමත් අතීතයේ පටන් ශ්‍රී ලංකාව සමුද්‍රාසන්න වෙළෙඳ මධ්‍යස්ථානයක් වීමට හේතු විය.
(2) ඉන්දියානු සාගර වෙළෙඳ මාර්ග ආසන්නයේ පිහිටා තිබීමත් ස්වාභාවික වරාය කිහිපයක් තිබීමත් ශ්‍රී ලංකාව අතීතයේ සිට ම සමුද්‍රාසන්න වෙළෙඳ මධ්‍යස්ථානයක් වීමට හේතු විය.
(3) ශ්‍රී ලංකාව සමුද්‍රාසන්න වෙළෙඳ මධ්‍යස්ථානයක් වීමට හේතුව ඉන්දියානු සාගරයේ වෙළෙඳ මාර්ග ආසන්නයේ පිහිටා තිබීම යි.
(4) ශ්‍රී ලංකාව සමුද්‍රාසන්න වෙළෙඳ මධ්‍යස්ථානයක් වීමට ප්‍රධාන ම හේතුව වූයේ ඉන්දියානු සාගරය ආසන්නයේ පිහිටීම සහ ස්වාභාවික වරාය කිහිපයක් තිබීම යි.

**37.** ශ්‍රී ලංකාවේ විදග්ධ කාව්‍ය සම්ප්‍රදායයක් මතු වූ අවධියේ දී පවා ජන කාව්‍ය නිර්මාණය අවිච්ඡින්නව පැවතියේ ඊට සාම්ප්‍රදායික ව පැවති දේශීය ගුණය එහි ගැබ් වී තිබුණු නිසා ය. මෙම වාක්‍යයේ ඇතුළත් **තද්ධිත පද** වනුයේ
(1) සාම්ප්‍රදායික, දේශීය (2) දේශීය, අවිච්ඡින්නව (3) උරුමය, සාම්ප්‍රදායික (4) දේශීය, නිර්මාණය

**38.** ධීවර ව්‍යවහාරයේ **කොල්ලෑව** යන්නෙන් අදහස් කෙරෙන්නේ
(1) විශාල ඔරු විශේෂයකි (2) ඔරුවේ හබලයි (3) යාත්‍රා විශේෂයකි (4) ඔරු කඳට සවි කළ ආධාරකයකි

**39.** "ජාතික සංවර්ධනය සඳහා තරුණයෝ උද්යෝගයෙන් ක්‍රියා කරන බව අපිට සිතෙනවා." යන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට **වඩාත් නිවැරදි වාක්‍යය** සහිත වරණය තෝරන්න.
(1) ජාතික සංවර්ධනයෙහි ලා තරුණයෝ උද්යෝගයෙන් ක්‍රියා කරති'යි අපි සිතමු.
(2) ජාතික සංවර්ධනයෙහි ලා තරුණයන් උද්යෝගයෙන් ක්‍රියා කරති'යි අපට සිතේ.
(3) ජාතික සංවර්ධනයෙහි ලා තරුණයන් උද්යෝගයෙන් ක්‍රියා කරති'යි අප සිතමු.
(4) ජාතික සංවර්ධනයෙහි ලා තරුණයෝ උද්යෝගයෙන් ක්‍රියා කරති'යි අප සිතමු.

**40.** "පුල් තඹරෙහි බිමීය බිඟු බිමීය - මල් සර සැව් ඇමීය රියහිමීය"
යන පද්‍යාර්ධයෙහි **වඩාත් නිවැරදි අදහස** තෝරන්න.
(1) පිපුණු නෙළුම් මල් වටා බඹරා කැරකුණේ ය. අනංගයා ඒ විඳින්නට පටන් ගත්තේ ය.
(2) නෙළුම් මල් පිපී ඇත. මී මැස්සෝ අවට පියාඹති. අනංගයා තම මල් දුන්න බිම ඇමී ය.
(3) පිපුණු නෙළුම් මල්වල මී බී බඹරා කැරකුණේ ය. රතියගේ ස්වාමියා මල් හී ද දුන්න ද අත හැරියේ ය.
(4) පිපුණු පියුම් අතර කැරකුණු මී මැස්සන් නිසා අනංගයාට තම දුන්න අත හැරීමට සිදු විය.

* *

[ 5 වන පිටුව බලන්න

# සිංහල භාෂාව හා සාහිත්‍යය II

* ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

**1.** අංක **i** සිට **x** තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

i සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන නාසික්‍ය අක්ෂර **දෙකක්** ද, ඌෂ්මාක්ෂර **දෙකක්** ද ලියා දක්වන්න.

ii පහත සඳහන් පද දෙකෙහි **විරුද්ධාර්ථ** පද ලියන්න.
(අ) දුෂ්කර
(ආ) සමීපස්ථ

iii මෙහි 'අ' හා 'ආ' කොටස්වල එන වාක්‍ය දෙකෙහි ඇති **සදොස් වචන දෙක නිදොස් කොට** ලියන්න.
(අ) ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වූ වාපි හා වාරි මාර්ග පද්දතිය අපේ වටිනා සංස්කෘතික උරුමයකි.
(ආ) ළමයින්ගේ පෝශණ අවශ්‍යතා පිළිබඳ ව දෙමාපියන් සැලකිලිමත් විය යුතු බව වෛද්‍යවරු පවසති.

iv පහත සඳහන් වාක්‍ය දෙක **නිදොස් කොට** ලියන්න.
(අ) වෛද්‍යවරු නිසා අසරණ රෝගීන් ඉක්මන් සුවය ලබති.
(ආ) සුප්‍රකට ලේඛිකාවක් වන්නේ කෙසේ ද?

v පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් **නිපාත පද දෙක** තෝරා ලියන්න.
උදේ සිට පැවති අධික වාහන තදබදයෙන් පසු පිරිස ප්‍රමාද වී නියමිත ස්ථානයට ළඟා වූහ.

vi නුවර කලාවියේ ජනවහරේ යෙදෙන පහත සඳහන් **වචනවල අදහස** ලියන්න.
(අ) ගොන් කවඩි හැල්ල
(ආ) කිලං හැළිය

vii පහත වචන දෙක යොදා අර්ථය පැහැදිලි වන සේ ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය **දෙකක්** ලියන්න.
(අ) ප්‍රසාදය
(ආ) ප්‍රාසාදය

viii පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය **කර්ම කාරකයට** හරවා ලියන්න.
(අ) මව දරුවන් රැක්කා ය.
(ආ) වෙද මහතා රෝගියෙකු සුවපත් කරයි.

ix පහත සඳහන් වාක්‍ය දෙකෙහි තද කළු අකුරින් දැක්වෙන පද **කවර ව්‍යාකරණ අංගයකට** අයත් දැයි දක්වන්න.
(අ) අලුත් සහල් මංගල්‍යයේ ප්‍රධාන ම අවස්ථාව වනුයේ අලුත් සහලින් පිසූ **කිරිබත්** දළදා සමිඳුන්ට පූජා කිරීම යි.
(ආ) යකුන් **උදෙසා** පඬුරක් බැඳ පොල් ගෙඩියක් ඇතින් රැගෙන කපු මහතා යැදීම ආරම්භ කරයි.

x පහත සඳහන් වචන **දෙකෙහි** අනුක්ත රූප ලියන්න.
(අ) බිරිඳක්
(ආ) විද්වත්හු

**(ලකුණු 02 x 10 = 20)**

[ 6 වන පිටුව බලන්න

**2.** පහත දැක්වෙන **අ, ආ, ඉ, ඊ** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන, **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) මනා ශරීර ශක්තියෙන් යුත් සෞඛ්‍ය සම්පන්න පිරිසක් බිහි කරලීම සඳහා ක්‍රීඩාවෙන් සිදු වනුයේ අමිල මෙහෙවරකි. පාසල් අධ්‍යාපනයට සමගාමී ව මෙන් ම පරිබාහිරව ද පාසල් සිසුන්ගේ ක්‍රීඩා කෞශල්‍යය නගා සිටුවීමට දියත් කෙරෙන වැඩසටහන් ද බහුල ය. එහෙත් වර්තමානයේ සංකීර්ණ අධ්‍යාපන පසුබිමක් යටතේ ක්‍රීඩාවට ලැබෙන අවස්ථා ක්‍රමයෙන් ගිලිහී යන අයුරු දක්නට ලැබේ. මෙම තත්ත්වය මග හරවා ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීම කාලෝචිත ය.

(ආ) වන අලි උවදුර වනාන්තර ආශ්‍රිත ව පිහිටි ගම්වල වෙසෙන්නන් බහුල වශයෙන් මුහුණපාන ශෝචනීය අත්දැකීමකි. කැලෑ එළි කිරීම නිසා වනාන්තර ආශ්‍රිත ව ආහාර සපයා ගැනීමට ඇති අපහසුතාව හේතුවෙන් වන අලි ගම් වැදීම මෙයට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැකි ය. මෙම ව්‍යසනයෙන් මිනිස් ජීවිතත් දේපළත් ආරක්ෂා කර ගැනීමට සුදුසු පියවර ගැනීමට වගකිවයුත්තන්ගේ අවධානය යොමු විය යුතු ය.

(ඉ) දිනෙන් දින වර්ධනය වෙමින් පවතින මාර්ග අනතුරු හේතුවෙන් අහිමි වන මිනිස් ජීවිත සංඛ්‍යාව අපමණ ය. අධික වේගයෙන් රිය පැදවීමත් මාර්ග සංඥා නොතකා හැරීමත් මිනිස් ජීවිත පිළිබඳ ඇති අවතක්සේරුවත් පදිකයන් දක්වන නොසැලකිලිමත් බවත් මෙම තත්ත්වයට හේතු වී ඇති බව පෙනේ. මෙවැනි ව්‍යසනවලින් ආරක්ෂා වීම සඳහා මිනිස් සන්තානයේ මානසික සංවර බවක් ඇති කිරීමත් දැඩි නීති ක්‍රියාත්මක කිරීමත් කාලීන අවශ්‍යතාවකි.

(ඊ) ආහාර නිෂ්පාදනයට ලබා දෙන දිරි ගැන්වීම ඒවා සංරක්ෂණය කර ගැනීම සඳහා ද යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණක් වී ඇත. නිෂ්පාදිත වී, එළවලු හා පලතුරු අස්වැන්න සැලකිය යුතු මිලකට විකුණා ගැනීමට නො හැකි ව ගොවීන් අසරණ භාවයට පත් වී ඇති අයුරු අසන්නට දකින්නට ලැබීම සුලභ දෙයකි. මෙයට හේතුව පෞද්ගලික වෙළෙඳුන්ගේ බලපෑම යි. මෙසේ පෞද්ගලික අංශයේ වෙළෙඳුන්ගේ සූරා කෑමට ලක්වන ගොවියා ආරක්ෂා කර ගැනීම රජයේ වගකීමකි.

**(ලකුණු 25 යි)**

**3.** පහත දැක්වෙන ඡේදය වචන **50 - 60** අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට **ලියන්න**. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

රටේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මය වුවත් අපේ පාසල්වල කෘෂිකර්මය ඉගැන්වීම එතරම් සැලකිල්ලට භාජන නො වීය. 1962 දී ද මේ වැදගත් ප්‍රශ්නයට විසඳුමක් සෙවීමට අත්හදා බැලීම් තත්ත්වයේ වෙනත් ප්‍රයත්නයක් දැරිණි. තෝරා ගත් පාසල් කිහිපයක 6, 7 සහ 8 යන පන්තිවල විද්‍යාත්මක කෘෂිකර්මය ඉගැන්වීමට සැලැස්මක් සම්පාදනය කෙරුණේ ය. මේ සඳහා විදේශීය විශේෂඥ උපදෙස් ලබා ගැනිණි. ජල පහසුව ඇති කුඩා අත්හදා බැලීමේ භූමි භාගයක අවශ්‍ය පහසුකම් හා උපකරණ සහිත කෘෂිකර්ම විද්‍යාත්මක විද්‍යාගාරයක් ඇතිව, ප්‍රමිත කෙරුණු විශේෂ අංශයක් සැලසුම් කෙරිණි.
මේ විෂයය ඉගැන්වීමට ද්විතීයික පුහුණු තත්ත්වයේ විශේෂඥ ගුරුවරුන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආධාරයෙන් පුහුණු කෙරුණු අතර කෘෂිකර්මය පිළිබඳ විශේෂඥ පරීක්ෂක තනතුරක් ද ඇති කෙරිණි. පාඨමාලා සහ නිර්දේශ පත්‍ර සහිත විස්තරාත්මක ඉගැන්වීමේ පටිපාටි සහ ගුරු අත්පොත් සුදානම් කරන ලදි. තව ද මේ විශේෂඥ ගුරුවරුන්ට විධිමත් උපදෙස් දෙනු ලැබී ය. බීජ සහ පොහොර ආදිය මිලයට ගැනීම සඳහා මුදල් වෙන් කරන ලදි. 9 සහ 10 පන්තිවලට ද මේ වැඩපිළිවෙළ දීර්ඝ කරන ලදුව අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා ද පසුව අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා ද කෘෂිකර්ම විද්‍යාව විෂයයක් ලෙස පිළිගැනිණි. මේ සියලු ප්‍රයත්න මධ්‍යයේ වුව ද විශේෂ කෘෂිකර්ම විද්‍යා අංශ ඇති පාසල් ස්වල්පයේ ශිෂ්‍යයන් අතර පවා කෘෂිකර්මය ජනප්‍රිය විෂයයක් වී යයි කීම අපහසු ය. අපේ අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන ගැටලුවක් වන මෙය විසඳිය හැකි වුවත් තව ම විසඳී නො මැත.

**(ලකුණු 10 යි)**

**4.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.

සමාජයේ සෑම පුද්ගලයකු ම තම පෞරුෂය කෙරෙහි අභිමානයක් ඇති කර ගන්නේ නම් එය සමාජ විෂමතා නැති කිරීමටත් සදාචාරාත්මක සංස්කෘතියක හිමිකරුවන් වීමටත් රටේ දියුණුවටත් මහත් රුකුලක් වෙයි. වැඩිහිටියන් විසින් බාල පරම්පරාවට උරුමකර දෙනු ලබන්නා වූ සියලු ම පාරිසරික හා මානසික ක්‍රියාවලිය පෞරුෂ වර්ධනය කෙරෙහි බලපායි.

දියුණු වන ලෝකයේ ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජ රටාවට අනුව ජීවත් වීමේ දී අවශ්‍ය දැනුම, අත්දැකීම් යහපත් ආකල්ප, නිපුණතා වර්ධනය වැනි කරුණුවල ද වෙනස් වීම් අඩු වැඩි වීම් ඇති බව විශේෂයෙන් කිව යුතු නො වේ. ජනගහන වර්ධනය හා නාගරික බලපෑම නිසා පවුල හා ජන සමූහයා අතර සම්බන්ධතාව ඉතා ලිහිල් ස්වරූපයක් ගෙන ඇත. මෙබඳු පරිසරයක් යටතේ හැදෙන වැඩෙන ළමයාට ජීවත් වීමේ දී ගැටලු හා ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වේ. එහෙයින් කාංසාව, බිය, ලැජ්ජාව වැනි අයහපත් චිත්තවේගවලට ගොදුරු වී සිතින් පීඩා විඳින පුද්ගලයන් බිහි වීමට ඉඩ ඇත. මේ නිසා කුඩා දරුවන් තුළ යහපත් චිත්තවේග වර්ධනය කිරීමට වැඩිහිටියන් වඩාත් උනන්දු විය යුතු ය. ඒ අනුව එම වගකීම් ඉටු කිරීම සඳහා පෞරුෂය කෙරෙහි බලපාන සාධක පිළිබඳ දැනුවත් වීම අවශ්‍ය ය.

i. පුද්ගලයන් තම පෞරුෂය කෙරෙහි අභිමානයක් ඇති කර ගැනීමෙන් සිදුවන යහපත කුමක් ද?
ii. බාල පරම්පරාවේ පෞරුෂ වර්ධනය කෙරෙහි බලපාන්නේ කුමක් ද?
iii. ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජ රටාව අනුව ජීවත් වීමේ දී වෙනස් වීම් හා අඩු වැඩි වීම් ඇති විය හැකි කරුණු **දෙකක්** ලියන්න.
iv. පවුල හා ජන සමාජය අතර සම්බන්ධතාව ලිහිල් ස්වරූපයක් ගැනීමට හේතුව කුමක් ද?
v. සිතින් පීඩා විඳින පුද්ගලයන් බිහි වීමට ඉඩ ඇත්තේ කවර හේතුවක් නිසා ද?

**(ලකුණු 10 යි)**

**5.** වීරරත්න සමූහ ව්‍යාපාරය තම ආයතනයට පරිගණක ක්‍රියාකරවන්නන් බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන අයගෙන් අයදුම්පත් කැඳවා ඇත.

- ★ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
- ★ වයස අවු.35ට අඩු වීම
- ★ අ.පො.ස. (උසස් පෙළ) සමත් වී තිබීම
- ★ පරිගණක විෂය පිළිබඳ ඇති පළපුරුද්ද

ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇතැයි සලකා යථෝක්ත තනතුරට අයදුම් කිරීම සඳහා සුදුසු අයදුම් පත්‍රයක් පිළියෙල කරන්න. (මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

**නැතහොත්**

ඔබ ගමේ පිහිටුවා ඇති ප්‍රජා සෞඛ්‍ය සංවිධානය ගැමියන්ගේ සෞඛ්‍ය පුරුදු නංවාලීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. එහි පළමු පියවර වශයෙන් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ ප්‍රධානත්වයෙන් දැනුවත් කිරීමේ රැස්වීමක් පැවැත්වීමට යෝජනා වී ඇත. රැස්වීමේ ආරාධිත දේශනය පැවැත්වීමට ද ඔහු තෝරා ගෙන ඇත. මෙම සංවිධානයේ ලේකම් ඔබ යැයි සිතා මේ කාර්යය සඳහා ආරාධනය කරමින් මහජන සෞඛ්‍යය පරීක්ෂක වෙත යැවීමට සුදුසු රාජකාරී ලිපියක් ලියන්න.
(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

**(ලකුණු 15 යි)**

* * *

# අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

පැය දෙකයි

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

* **1, 2, 3, 4** ප්‍රශ්නවලටත් **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80** කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි අංකය ලියා ඉරක් අඳින්න.

(i) "මට කියන්න දෙයක් හිතා ගන්ට බැරිවුණා. හිනා ගියා විතරයි."

(අ) මේ හා සම්බන්ධ අවස්ථාව කුමක් ද?

(ආ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය රචනා කර ඇත්තේ කවරෙකු විසින් ද?

(ii) "ඒ විස්මය දුටු මහ පිරිස එකවිට ම සාධුකාර දුන්හ."

(අ) මෙම පාඨය ඇතුළත් මුල් කෘතියේ නම කුමක් ද?

(ආ) මෙම පිරිස දුටු විස්මය කුමක් ද?

(iii) සුදු සක ලෙසට ඇත් පැටියෙක් විත් යහනේ
සුදු සොඬ ටිකෙන් මගෙ බඩ පිරිමදිති අනේ

(අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) මෙම කවිය ලියවුණු යුගයේ රචිත වෙනත් කාව්‍ය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(iv) "තෙපි මාගේ සහජාත පුත්‍රයහ. තෙල සැපත් තෙපි ම ගන්ව. "

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙහි තෙල සැපත් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(v) "හමන සුවඳ සිසිලස ලිය මඬුලු වලා
ගිමන නිබඳ සතපා උනිමු ලොබ වලා"

(අ) ඉහත කවිය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?

(ආ) එම කෘතිය කුමන සාහිත්‍ය යුගයකට අයත් ද?

(vi) "ඒත් ඊයෙ මුළු දවසෙ ම වැස්ස නෙව? එක ගොයියෙක්වත් වැඩ කළේ නැහැ."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) එම ප්‍රකාශය කා හට පැවසූවක් ද?

(vii) (අ) 'උත්තරෝලිය වස්තුව' පාඩම උපුටා ගෙන ඇත්තේ කුමන සාහිත්‍ය ග්‍රන්ථයකින් ද?

(ආ) එහි කතුවරයා කවරෙක් ද?

(viii) මල් සර හට හී සපයන්නී
යොවුනන් සිත් ඉන් බැඳලන්නී

(අ) මෙහි දැක්වෙන ධ්වනිතාර්ථවත් යෙදුම උපුටා ලියන්න.

(ආ) මේ පද්‍ය පන්තිය කාගේ නිර්මාණයක් ද?

(ix) ම තිබු දන සියලු
දෙවයි වයි කී බස් ඇම්සිමුලු

(අ) කාව්‍යශේඛරයේ දැක්වෙන පරිදි මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරෙකු විසින් ද?

(ආ) කාව්‍යශේඛරය රචනා කර ඇත්තේ කිනම් ජාතක කතාවක් ඇසුරින් ද?

(x) කිසාගෝතමියක ලෙසින් ඇය - ලොවට අත පා අයැද සිටියේ
මියැදි බිලිඳුට නැවත පණ නො ව - මියෙන පොඩි පුතු රකින මගකි ය

(අ) මේ පද්‍ය කොටසෙහි ඇතුළත් උපමාව තෝරා ලියන්න.

(ආ) මෙම කවියා කුමන සාහිත්‍ය යුගයකට අයත් ද?

**(ලකුණු 02 x 10 = 20 යි)**

[ 2 වන පිටුව බලන්න

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන්පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(අ) **නුවෙන්** අප අයැති
**පසු පෙය** දෙන්ට මං නැති
ණය කවුරු දන් දෙති
සිලව් කොට ඒ යළි එකෙක් ඇති

(ආ) "එකල **කර්මාන්විත** වූ ව්‍යාධියක් හැර අවශේෂ වූ ව්‍යාධි එක ආලේප මාත්‍රාවකින් **අන්තර්ධාන** වන තරම් දිව්‍යමය වූ ඖෂධ උගන්වන්නා වූ ශක්‍රයෝ ජීවකයන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි වෛද්‍ය ශාස්ත්‍රය උගන්වා නිම වූහ."

(ඉ) ජම්බු ගහට **රත** **පොරවන්නී**
බක් මී ගහ කහ අන්දන්නී
අඹ දලු ලා රත තවරන්නී
**ලෝ කත** විසිතුරු කැරලන්නී

(ඊ) "එසේ හෙයින් ඒකාන්තයෙන් උපායක් නැතිව **නිස්කාරණයෙහි** තමන්ට අභිවෘද්ධියක් ප්‍රාර්ථනා කරන්නා වූ සත්ත්වයෝ ආචාරීන් මෙන් මහත් විනාශයට පැමිණෙති'යි සිතා, තව ද මෙසේ මහ බෝසතාණෝ යම් සේ අපගේ ආචාරීන් උපායක් නැතිව ම **අස්ථානයේ** උපායක් නැති වීර්ය කෙරෙමින් .........."

**(ලකුණු 5 × 4 = 20 යි)**

- **3, 4** යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන **125ක්** පමණ තිබීම සෑහේ.

**3.** "පියසේන ඇසූ ප්‍රශ්නයක්" කවි පෙළේ සාර්ථක භාවයට හේතු වී ඇත්තේ,
(අ) සංවේදී සිදුවීමක් පාදක කර ගැනීම හා
(ආ) සරල බස් වහරක් යොදා ගැනීම යන කරුණු ය.
එක් කරුණකට නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(අ) හාස්‍යය ජනිත වන ආකාරයේ චරිත හැසිරවීමත්,
(ආ) ඒ සඳහා යෝග්‍ය අවස්ථා නිරූපණයත් නිසා,
මඟුල් ප්‍රස්තාව නාට්‍යය පාඨකයාගේ (ප්‍රේක්ෂකයාගේ) සිත් ඇද බැඳ තබා ගනී.
එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

**(ලකුණු 15 යි)**

**4.** කථා රසය කුළු ගැන්වෙන අයුරින් චරිත හැසිරවීම සද්ධර්මරත්නාවලියෙහි දක්නට ඇති සුවිශේෂී ලක්ෂණයකි. හත්ත හත්තික සිටාණෝ කතාවෙහි දැක්වෙන,
(අ) ගන්ධක සිටුවරයාගේ චරිතය හා
(ආ) හත්ත හත්තික සිටුවරයාගේ චරිතය
ඇසුරින් නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(අ) පාඨකයාගේ කුතුහලය දනවන අයුරින් කතාව ඉදිරිපත් කිරීමත්,
(ආ) සිද්ධි ගැළපීමේ අනුපිළිවෙළත් නිසා,
උත්තරෝලිය කතා වස්තුව පාඨක සම්භාවනාවට පාත්‍ර වේ.
එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් මේ කියමන පැහැදිලි කරන්න.

**(ලකුණු 15 යි)**

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න. (උත්තරයක වචන **100ක්** පමණ තිබීම සෑහේ.)

**5.** මනුෂ්‍ය සන්තානයේ පවත්නා දුර්වලතා සියුම් ලෙස විවරණය කිරීමට ජාතක කතාකරු දක්වා ඇති කුසලතාව වේදබ්භ ජාතක කථාව ඇසුරින් උදාහරණ **තුනක්** දක්වමින් විමසන්න.

**6.** "වැස්ස කවි පෙළ පාඨක සම්භාවනාවට පාත්‍ර වූයේ පරිසරයේ ඇති වන වෙනස්කම් වාක් චිත්‍ර මවමින් විචිත්‍රාකාරයෙන් ඉදිරිපත් කිරීම නිසා" ය. උදාහරණ **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න.

**7.** "පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා කෙටි කතාවේ සාර්ථකත්වයට හේතු වී ඇත්තේ සමාජයේ පවත්නා පන්ති විෂමතාව සිත් ගන්නා ආකාරයෙන් නිරූපණය කිරීම" යි. උදාහරණ **තුනක්** දක්වමින් විමසන්න.

**(ලකුණු 10 යි)**

* * *